*සැ. යු.-* (i) 2016.08.19 දින පළවූ අංක 1981 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළනොවීය.
(ii) මෙවර පළවන ගැසට් පත්‍රයේ vi කොටසේ 2016 වර්ෂය සඳහා කුරුණෑගල සහ කුලියාපිටිය අධිකරණ කලාපවලට අයත් ජූරිසභික-යින්ගේ නාමාවලියක් භාෂාත්‍රයෙන්ම පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 1,982 - 2016 අගෝස්තු මස 26 වැනි සිකුරාදා - 2016.08.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 1602 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1611 |


*සැ. යු.-* මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත 2016 ජුනි මස 10 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 සැප්තැම්බර් මස 15 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 සැප්තැම්බර් මස 02 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2016 ජුනි මස 21 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


1599- B 81091— 5,403 (2016/08)
B 1 -

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්ලුට්ටින් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — මහනුවර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 සැප්තැම්බර් මස 26 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 අගෝස්තු මස 09 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මහනුවර | කඩවත් සතර හා ගඟවට කෝරළය | පොල්වත්ත අම්පිටිය ප්‍රදේශයේ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |

08-700

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කුරුණෑගල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබා ගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 සැප්තැම්බර් මස 27 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 අගෝස්තු මස 08 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කුරුණෑගල | පඬුවස්නුවර බටහිර | ගිරිතලාන කෝරළය කොට්ඨාසයේ උප්පැන්න මරණ සහ දේවමැදි හත්පත්තුව කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල |

08-681

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — මහනුවර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන් වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබා ගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 සැප්තැම්බර් මස 26 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 අගෝස්තු මස 08 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මහනුවර | දෙළුව | උඩපළාත කොට්ඨාසයේ ආඬියාකඩවත ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර. |

08-679

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — මහනුවර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන් වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 සැප්තැම්බර් මස 26 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 අගෝස්තු මස 08 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මහනුවර | උඩුනුවර | උඩුනුවර හා යටිනුවර කොට්ඨාසයේ කඳුපළාත ප්‍රදේශයේ රම්මලක මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර. |

08-680

---

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

මුදල් අමාත්‍යාංශය - තක්සේරු දෙපාර්තමේන්තුව

**නීති නිලධාරි (විධායක නිලධර ගණයේ III ශ්‍රේණියේ) තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම - 2016**

තක්සේරු දෙපාර්තමේන්තුවේ නීති නිලධාරි තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

තනතුරු සංඛ්‍යාව - 01

01. *බඳවා ගැනීමේ ක්‍රමය* :

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා පුරප්පාඩුව සඳහා බඳවා ගනු ලැබේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 06 යටතේ සඳහන්) ලකුණු දීමේ පටිපාටියට අනුකූලව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

02. *අවශ්‍ය සුදුසුකම්* :

(i) අධ්‍යාපන /වෘත්තීය සුදුසුකම්
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් නීතිය පිළිබඳව උපාධියක් ලබා තිබීම හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම.

(ii) පළපුරුද්ද
ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු වසර තුනකට (03) නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

(iii) කායික සුදුසුකම්
සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(iv) වෙනත්

- ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
- අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
- 2016.09.26 දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිරය. එය විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුවේ.

(ii) මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්ය. තනතුරට බඳවා ගෙන වසර 03ක් ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් ආකාරයට පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතු ය.

(iii) 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හි විධිවිධාන හා ඊට ආනුශාංගික වන චක්‍රලේඛවල විධිවිධාන අනුව මෙම පත්වීම භාරගත් දින සිට වර්ෂ පහක් ඉකුත් වීමට පෙර, අදාළ පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත් බව සනාථ කළ යුතුවේ.

(iv) මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටිය රීති සහ තක්සේරු දෙපාර්තමේන්තුවේ නීති නිලධාරි තනතුරට අදාළ බඳවා ගැනීමේ පටිපාටියට දැනටමත් කර ඇත්තාවූ ද, මතුවට කරනු ලබන්නාවූ ද, සංශෝධනයන්ට හා විධිවිධානයන්ට යටත්වේ.

04. *වයස් සීමාව* :
ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

05. *වැටුප් පරිමාණය* :
2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන 1 අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 47,615-10x1,335-8 x 1,630-17 x 2,170 - රු. 1,10,895 (SL-01-2016) වේ. ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන 11 හි සඳහන් පරිදිවේ. (*උදා.* 2016.01.01 දින සිට 2016.12.31 දින දක්වා අදාළ වනුයේ රු. 27,871ක මූලික වැටුපක් හා රු. 9,651 ක ගැලපුම් දීමනාවකි.)

06. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.

| | *විෂයය* | | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 01 | අතිරේක අධ්‍යාපන සුදුසුකම් : | | 20 |
| | පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලද නීතිය පිළිබඳ උපාධිය | | |
| | - පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 20 | |
| | - දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සඳහා | 15 | |
| | - දෙවන පන්තියේ පහළ සාමාර්ථයක් සඳහා | 10 | |
| | නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 15 | |
| | නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථයක් සඳහා | 10 | |
| | (උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදේ - උපාධිය හෝ නීති විද්‍යාල සුදුසුකම් වලින් එකක් සඳහා පමණි) | | |
| 02 | අතිරේක වෘත්තීය සුදුසුකම් : | | 15 |
| | පිළිගත් ආයතනයක් වශයෙන් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ අවුරුද්දකට නොඅඩු පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ පශ්චාත් නීති ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 05 බැගින්) | | |

| | *විෂයය* | | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| | පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 06කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 03 බැගින්) | | |
| | පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 03 කට නොඅඩු සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා (එක් පාඨමාලාවකට ලකුණු 02 බැගින්) | | |
| 03. | *අතිරේක පළපුරුද්ද :* | | 30 |
| | නීතිඥවරයෙකු ලෙස රාජ්‍ය සේවයේ හෝ පෞද්ගලික අංශයේ පළපුරුද්ද - මාස 06ට වැඩි හා අවුරුද්දකට අඩු - ලකුණු 02 එක් වසරකට ලකුණු 05 බැගින් උපරිමය ලකුණු 30 (මූලික සුදුසුකම ලබාගැනීම සඳහා අවශ්‍යවන නීතිඥයෙකු ලෙස කටයුතු කළ වසර 03ක සේවා කාලය හැර) | | |
| | (අවුරුදු 20කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරයෙකුගේ හෝ ජනාධිපති නීතිඥවරයෙකුගේ හෝ විනිසුරුවරයෙකුගෙන් ලබාගත් සහතිකයක් මගින් අතිරේක පළපුරුද්ද සනාථ කළ යුතුය.) | | |
| 04. | *ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව :* | | 15 |
| | ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන ලද පශ්චාත් උපාධිය/උපාධිය/පශ්චාත් නීතිවේදී උපාධිය/නීතිවේදී උපාධිය (අදාළ විභාග ප්‍රශ්නපත්‍ර සියල්ල සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සපයා තිබිය යුතුය.) | 15 | |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨාමාලාවක් සඳහා (වසර 01ක් හෝ පැය 1500) | 10 | |
| | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා | | |
| | - මාස 06/පැය 720 | 07 | |
| | - මාස 03/පැය 360 | 05 | |
| 05. | *තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම :* | | 15 |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයක් ලෙස හදරා තිබීම සඳහා | 15 | |
| | රජයේ පිළිගත් ආයතනයක අවුරුදු 01කට නොඅඩු තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨාමාලාවක් සඳහා හෝ පැය 1500 සඳහා | 10 | |
| | රජයේ පිළිගත් ආයතනයක තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා - | | |
| | - මාස 06/පැය 720 | 07 | |
| | - මාස 03/පැය 360 | 05 | |
| 06. | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව | | 05 |
| | මුළු එකතුව | | 100 |

07. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතාපත්‍ර පිළිගනු ලැබේ :

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත්‍රය,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

08. *අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය* :

(i) අයදුම්පත් 2016.09.26 දිනට හෝ එදිනට ප්‍රථම පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුවේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ :

ලේකම්,
මුදල් අමාත්‍යාංශය,
මහලේකම් කාර්යාලය, කොළඹ 01.

(ii) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 08 දක්වාත් 02 වන පිටුව අංක 09 සිට 11 දක්වාත් 03 වන පිටුව අංක 12(1)-12(11) දක්වාත් වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය.

(iii) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "තක්සේරු දෙපාර්තමේන්තුවේ නීති නිලධාරි තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම්පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතු ය.

(iv) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥවරයෙකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු/පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 22,935කට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතු ය.

(v) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතු ය.

(vi) මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

09. *සාවද්‍ය තොරතුරු සැපයීම* :

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
මුදල් අමාත්‍යාංශය.

මහලේකම් කාර්යාලය,
කොළඹ 01.

**ආදර්ශ අයදුම්පත්‍රය**

(අයදුම්පත්‍රය පහත සඳහන් පරිදි පිළියෙල කළ යුතුය.)

තක්සේරු දෙපාර්තමේන්තුවේ නීති නිලධාරි තනතුරට බඳවා ගැනීම සඳහා ඉල්ලුම්පත්‍රය

01. අයදුම්කරුගේ නම :

1.1 මුලකුරු සමග නම :————.

1.2 සම්පූර්ණ නම :————.

(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

02. පෞද්ගලික ලිපිනය :————.

(සිංහලෙන්/දෙමළෙන්) :————.

(ලිපිනය වෙනස් වුවහොත් ඒ බැව් වහාම දැන්විය යුතු ය.)

03. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් ලිපිය එවිය යුතු ලිපිනය :
ඉංග්‍රීසි කැපිටල් අකුරින් :————.

සිංහලෙන්/දෙමළෙන් :————.

04. ස්ත්‍රී පුරුෂ භාවය : පුරුෂ : ☐
(පුරුෂ 01, ස්ත්‍රී 02) ස්ත්‍රී : ☐

05. ඔබ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල සහ ඉංග්‍රීසි - 1 ☐
දෙමළ සහ ඉංග්‍රීසි - 2

06. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද යන වග :————.

07. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

08. උපන් දිනය :

වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

8.1 ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට වයස :

අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

09. (i) වෘත්තීය හා අනෙකුත් සුදුසුකම් :————.

(ii) දෙවන භාෂාව පිළිබඳ ලබා ඇති ඉහළම සුදුසුකම :————.

(iii) පළමු භාෂාව පිළිබඳ ලබා ඇති ඉහළම සුදුසුකම :————.
(අ.පො.ස. (සා.පෙ.)/(උ.පෙ.) විභාගවලින් නම් වර්ෂය හා ඔබ ලැබූ ශ්‍රේණිය (සම්මාන/විශිෂ්ට) සඳහන් කළ යුතු වේ.)

(iv) (i) උපාධි සුදුසුකම් :

| *උපාධිය* | *විෂයයන්* | *සාමාර්ථය (පන්තිය)* | *වර්ෂය* | *විශ්වවිද්‍යාලය* |
|---|---|---|---|---|
| | | | | |

(ii) පශ්චාත් උපාධි සුදුසුකම් :

| *පශ්චාත් උපාධියේ නම* | *උපාධිය පිරිනමන ලද වර්ෂය* | *විශ්වවිද්‍යාලය* |
|---|---|---|
| | | |

(v) නීතිඥ වෘත්තියේ පළපුරුද්ද :————.

10. අධිකරණය ඉදිරියේ ඔබ කිසියම් වරදකට වරදකරු වී ඇද්ද ?
ඔව්/නැත

ඔව් නම් ඒ පිළිබඳ විස්තර සපයන්න :————.

11. *අයදුම්කරුගේ සහතිකය* :

(*අ*) මෙම ඉල්ලුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා පරිදි සත්‍ය හා නිවැරදි බව ගෞරව බහුමානයෙන් යුක්තව ප්‍රකාශ කර සිටිමි.

(*ආ*) මා විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත්, මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව දැන සිටිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

12. 1. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම* :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ............................ මහතා/මහත්මිය/මෙනෙවිය මම පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය 2016 ............ මස ...... දින මා ඉදිරිපිට දී අත්සන තබන ලද බවත් සහතික කරමි.

————,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

සහතික කරන්නාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.

13. *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය* :

අයදුම්කරු/අයදුම්කාරිය ඉහතින් සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්, නිවැරදි බවත් ඔහුගේ/ඇයගේ වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් මෙම තනතුර සඳහා තෝරා ගතහොත් සේවයෙන් නිදහස් කළ හැකිය/නොහැකිය.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

තනතුර :————.
දිනය :————.

08-793

---

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ III වැනි ශ්‍රේණියේ පශු වෛද්‍ය නිලධාරී තනතුරු සඳහා බඳවා ගැනීම - 2016

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ III වැනි ශ්‍රේණියේ පශු වෛද්‍ය නිලධාරී තනතුරු 207ක් සඳහා බඳවා ගැනීමට සුදුස්සන් තෝරා ගැනීමට අදාළව අංක 1968 දරන 2016.05.20 දිනැති රජයේ *ගැසට්* පත්‍රයේ පළ කරන ලද අයදුම්පත් කැඳවීමේ නිවේදනය හා සම්බන්ධවයි. ඒ අනුව එම *ගැසට්* නිවේදනයේ 01 ඡේදයේ (අ) හි විධිවිධාන පහත පරිදි සංශෝධනය කරනු ලැබේ. :-

(*අ*) අයදුම්පත් කැඳවන අවසාන දිනය 2016.08.31 දින වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ඩී. කේ. ආර්. ඒකනායක,
ලේකම්,
ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය.

2016 අගෝස්තු මස 12 වැනි දින.

08-693

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර අධිපන්තියට අයත් පරිපාලන ග්‍රාම නිලධාරී තනතුර සඳහා සීමිත පදනම මත බඳවා ගැනීම සඳහා වන ලිඛිත තරග විභාගය - 2016

## Limited Competitive Examination for Promotion to Supra Grade of Grama Niladhari- 2016

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි 2011 වර්ෂයට අදාළව පැවැත්වීමට නියමිතව තිබූ ග්‍රාම නිලධාරී සේවාවේ අධිශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරග විභාගයේ 2011.12.06 දින *ගැසට්* නිවේදනය අවලංගු කරනු ලැබේ. 2016 වර්ෂයට අදාළව සීමිත පදනම මත ග්‍රාම නිලධාරී සේවයේ අධිශ්‍රේණියට උසස් කිරීම සඳහා මෙම *ගැසට්* නිවේදනයේ 4 වන වගන්තියේ සඳහන් සුදුසුකම් සපුරා ඇති ග්‍රාම නිලධාරී සේවයේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අදාළ විභාගය පවත්වනු ලබන මධ්‍යස්ථාන සහ මධ්‍යස්ථාන අංක සඳහන් ලැයිස්තුව, උපලේඛන අංක 01 වශයෙන් ද, දිස්ත්‍රික් අංක ලැයිස්තුව, උපලේඛන අංක 02 වශයෙන් ද, මෙම නිවේදනය අවසානයේ අමුණා ඇත.

01. **උසස් කිරීමේ ක්‍රමය :**

(i) සීමිත පදනම මත පුරප්පාඩු 104ක් පිරවිය යුතු අතර, විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයට පහත 04 ඡේදයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන අයදුම්කරුවන් විසින් පෙනී සිටිය යුතුය. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන තිදෙනෙකුගෙන් යුත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක්/මණ්ඩල මගින් සුදුසුකම් පරීක්ෂා කෙරේ. සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන් කැඳවීමේ දී ලිඛිත පරීක්ෂණය සමත් ලකුණු ප්‍රමාණය හෝ ඊට වැඩි ලකුණු ලබා ගන්නා ලද අයදුම්කරුවන් අතරින් ලිඛිත පරීක්ෂණයේ දී දක්වනු ලබන කුසලතාවය අනුව සකස් කරන ලද ප්‍රමුඛතා ලේඛනයක් අනුව සීමිත තරග විභාගය මගින් බඳවාගනු ලබන පුරප්පාඩු සංඛ්‍යාව හා එම පුරප්පාඩු සංඛ්‍යාවෙන් 25% ක ප්‍රමාණය යන දෙකෙහි එකතුවට සමාන අයදුම්කරුවන් ප්‍රමාණයක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

(ii) අධි ශ්‍රේණියට පත් කරනු ලබන නිලධාරීන් සේවා ස්ථානවලට අනුයුක්ත කිරීමේ දී පළමුව පවත්නා පුරප්පාඩු වලට ස්ථාන මාරුවීම් මඟින් දැනට සිටින නිලධාරීන්ට ස්ථාන මාරුවීමට අවස්ථාව ලබා දෙන අතර, එම ස්ථාන මාරු ලබා දීමෙන් පසු දිස්ත්‍රික්කය තුළ ඉතිරිවන පුරප්පාඩු වලින් 40% සඳහා විභාගයේදී ලබන ජ්‍යෙෂ්ඨත්වය මත සේවයේ සිටින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් බැහැර, දිස්ත්‍රික්කය තුළ වෙනත් කොට්ඨාසයට අනුයුක්ත කරන අතර, දිස්ත්‍රික්කය තුළ පවත්නා එම පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි ප්‍රමාණයක් සුදුසුකම් ලබා ඇති අවස්ථාවන්හි දී, එම අය දිස්ත්‍රික්කයෙන් පිටත පවත්නා පුරප්පාඩු සඳහා අනුයුක්ත කරනු ඇත. එසේ අනුයුක්ත කරනු ලබන ස්ථානවල පත්වීම් බාර නොගන්නා අයගේ පත්වීම් අවලංගු කරන අතර, එවැනි අයකුට පසු අවස්ථාවක දී එම පත්වීම් සඳහා මෙම විභාගයේ ප්‍රතිඵල මත නැවත ඉල්ලීමක් කිරීමට හිමිකම් නොලබනු ඇත.

02. **විභාග පටිපාටිය .**-අයදුම්කරුවන් පහත සඳහන් විභාගයට පෙනී සිටිය යුතුය. විභාගය පවත්වනු ලබන්නේ සිංහල හා දෙමළ මාධ්‍යවලින් පමණක් වන අතර, ඉල්ලුම් කරනු ලබන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. :

| | *විෂයය* | *විෂය අංකය* | *ලකුණු* | *කාලය* |
|---|---|---|---|---|
| 1. | කාර්යාල කළමනාකරණය හා කාර්යාල ක්‍රම | 01 | ලකුණු 100 | පැය 01 1/2 යි |
| 2. | ආයතන කාර්ය හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්‍ය පටිපාටික රීති හා රාජ්‍ය මුල්‍ය කළමනාකරණය | 02 | ලකුණු 100 | පැය 01 1/2යි |
| 3. | විෂයානුබද්ධ අධ්‍යයනය හා වෘත්තීය දැනුම | 03 | ලකුණු 100 | පැය 01 1/2 යි |
| 4. | පොදු ප්‍රශ්න පත්‍රය | 04 | ලකුණු 100 | පැය 01 1/2යි |

විභාගයේ දී අවම සුදුසුකම් ලැබීම සඳහා සෑම විෂයයක් සඳහා අවම ලකුණු 40ක් ලබාගත යුතු වේ.

03. **විෂය නිර්දේශය**

(i) කාර්යාල කළමනාකරණය හා කාර්යාල ක්‍රම (විෂය අංකය 01) :

කාර්යාල කළමනාකරණයට අදාලව සංවිධාන ව්‍යුහය සංවිධාන පිළිබඳ මූලධර්ම, කාර්ය විශ්ලේෂණය හා කාර්ය ඇගයුම්, නායකත්වය අධීක්ෂණය හා තීරණ ගැනීමේ හැකියාව, සංදේශනය මහජන සම්බන්ධතා සම්බන්ධීකරණය හා ගැටලු නිරාකරණය ආශ්‍රිතව පිළිතුරු සැපයිය යුතු අතර, කාර්යාල ක්‍රම සඳහා කාර්යාල ක්‍රම පිළිබඳ මූලධර්ම, කාර්යාල පටිපාටි, ලේඛන සහ ගොනු කිරීම, ආකෘති පත්‍ර පාලනය හා ආකෘති පත්‍ර සැළසුම් කිරීම, ලිපි ගනුදෙනු කිරීම, කාර්යාල උපකරණ භාවිතය පිළිබඳ පාලනය, කාර්යාලයේ සැළැස්ම හා වටපිටාව, රැකියා පිළිබඳ විස්තරය, වැඩ අධ්‍යයනය හා ක්‍රම අධ්‍යයනය, වැඩ මැනීම, වැඩ පියවර සකස් කිරීම යන අංශ ඇතුළත් ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු ය.

(ii) ආයතන කාර්ය හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රිති හා රාජ්‍ය මූල්‍ය කළමනාකරණය (විෂය අංකය 02) :

ආයතන කාර්ය හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති කොටසට අදාලව රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ දී අනුගමනය කළයුතු ක්‍රියා මාර්ග, රාජ්‍ය නිලධාරීන්ගේ ආයතනික කටයුතු, රාජ්‍ය සේවකයින් පත් කිරීම, මාරු කිරීම, උසස් කිරීම හා සේවය අවසන් කිරීම යන කාර්යයන්හි බලතල පැවරීම, රාජ්‍ය සේවක විනය, සුභ සාධනය, රාජ්‍ය නිලධාරීන්ට හිමි වරප්‍රසාද, ආයතන කාර්ය පිළිබඳ රජය හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති හා ඉදිරියේ දී නිකුත් කරනු ලබන රෙගුලාසි, කාර්ය පටිපාටි හා චක්‍රලේඛ පිළිබඳ සාමාන්‍ය අවබෝධය ආශ්‍රිත ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු අතර, රාජ්‍ය මූල්‍ය

කළමනාකරණය සඳහා වාර්ෂික ඇස්තමේන්තු හා ගණන් දීමේ නිලධාරියෙකුගේ වගකීම්, මුදල් පාලනය, මූල්‍ය වගකීම් පැවරීම, මුදල් බාර ගැනීම, ගිණුම්ගත කිරීම හා ප්‍රතිග්‍රහණය කිරීම, ගෙවීම්, රාජ්‍ය මුදල් භාරකාරත්වය, අග්‍රිම හා බැංකු ගිණුම්, සැපයුම් හා සේවාවන්, ටෙන්ඩර් කටයුතු, භාණ්ඩ සමීක්ෂණ, විගණන විමසුම්, රජයේ කාර්යාලවල භාවිතාවන ලෙජර්, ආදායම් හා වියදම් සාරාංශ, බැංකු සැසඳුම් හා මූල්‍ය පාලන පොත්, රාජ්‍ය මුදල් භාවිතය පිළිබඳ රජය විසින් මෙතෙක් නිකුත් කර ඇති රෙගුලාසි සහ චක්‍රලේඛ පිළිබඳ සාමාන්‍ය අවබෝධය යන අංශ ඇතුළත් ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු ය.

(iii) *විෂයානුබද්ධ අධ්‍යයනය හා වෘත්තීය දැනුම - (විෂය අංකය 03)* :
ග්‍රාම නිලධාරීන්ට විවිධ අණපනත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තු පළාත් සභා හා වෙනත් ව්‍යවස්ථාපිත රජයේ ආයතන මගින් පැවරී ඇති රාජකාරි විෂයයන් පිළිබඳ දැනුම පරීක්ෂා කරන අතර, එම පැවරී ඇති විෂයයන්ට අදාළ සිද්ධි අධ්‍යයනයක් ඇතුළත් වේ.

(iv) *පොදු ප්‍රශ්න පත්‍රය (විෂය අංකය 04)* :

රාජ්‍ය පරිපාලනයේ ස්වභාවය, රාජ්‍ය පරිපාලන ව්‍යුහය, රාජ්‍ය ප්‍රතිපත්ති හා නව රාජ්‍ය ප්‍රතිසංස්කරණ, මූලික අයිතිවාසිකම්, මානව හිමිකම්, මානව හිමිකම් කොමිෂන් සභාව, ඔම්බුඩ්ස්මන්වරයා, පාර්ලිමේන්තු මහජන පෙත්සම් කාරක සභාව, කාර්යාල සංස්කෘතිය, ආචාර ධර්ම හා සාරධර්ම, මැනවින් කාර්යාල භෞතික පරිසරය නිර්මාණය කිරීම, කාර්ය මණ්ඩලයේ සුභසාධක කටයුතු, නිල තත්වය හා සිවිල් තත්වය පිළිබඳ සමාජ විද්‍යාත්මක පිළිගැනීම්, සේවාලාභීන්ට රාජ්‍ය නිලධාරීන්ගෙන් ඉටුවිය යුතු යුතුකම් පිළිබඳ සාමාන්‍ය අවබෝධයක් අපේක්ෂා කෙරේ.

04. *සුදුසුකම්.*- අයදුම්පත් බාර ගන්නා අවසාන දිනයට අපේක්ෂකයින් පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු ය.:-

*වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද* :

(i) ග්‍රාම නිලධාරී I වන ශ්‍රේණියේ නිලධාරියෙකු වීම ;

හෝ

(ii) නියමිත දිනට අවම වශයෙන් ග්‍රාම නිලධාරී II ශ්‍රේණියේ වසර 08 කට නොඅඩු සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ ග්‍රාම නිලධාරී II වන ශ්‍රේණියේ නිලධාරියෙකු වීම ;

හෝ

(iii) අවම වශයෙන් ග්‍රාම නිලධාරී II වන ශ්‍රේණියේ අවුරුදු 05 කට නොඅඩු සක්‍රිය හා සතුටුදයක සේවා කාලයක් ඇති උපාධිධාරියෙකු වීම;

*වෙනත්* :

(i) නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණවලින් සමත් වී තිබීම.

(ii) නියමිත දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(iii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට්* පත්‍රයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

*සටහන* :

(i) 2010.09.29 දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ග්‍රාම නිලධාරී බඳවා ගැනීමේ පරිපාටියේ 14.1 හි II වගන්තිය යටතේ III වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරන ලදුව, එම බඳවා ගැනීමේ පරිපාටියෙහි 10. 1.1 වගන්තියේ විධිවිධාන අනුව II ශ්‍රේණියට උසස් කරන ලද නිලධරයන්ගේ පූර්ව II ශ්‍රේණියේ සේවා කාලය ද නියමිත සේවා කාලයක් ලෙස සලකනු ලැබේ.

05. *වැටුප් ක්‍රමය* :

(i) වැටුප් කේත අංකය - MN7 - 2016 (රු.41,580 - 11 x 755- 18 x 1,030 - රු. 68,425)

(මෙම වැටුප් පරිමාණය අනුව වැටුප් සකස් කිරීමේ දී 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි විධිවිධාන අදාළ වේ.)

(ii) උසස් කරනු ලබන නිලධාරීන් මෙම වැටුප් පරිමාණයේ වැටුප් පියවරෙහි පිහිටුවනු ලබන්නේ ආයතන සංග්‍රහයේ vii වන පරිච්ඡේදයේ 5 වන වගන්තිය සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 11/94 හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 7/2000න් කරන ලද සංශෝධනවලට අනුකූලවය.

06. ඉල්ලුම්පත් බාර ගැනීම :

* මෙම විභාගය සඳහා අයදුම් කිරීමේ ආදර්ශ අයදුම්පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ පළකර ඇත. ආදර්ශ අයදුම්පතට අනුකූලව පමණක් අයදුම්කරුවන් හෝ අයදුම්කාරියන් විසින් තමන්ගේ අයදුම්පත් පිළියෙල කර ගැනීම අවශ්‍ය වේ. අයදුම්පත් A4 කඩදාසියක දෙපැත්ත භාවිතයට ගනිමින් පිළියෙල කර ගත යුතු ය. අංක 01 සිට 05 දක්වා එහි මුල් පිටුවේ ද, ඉතිරි කොටස් ඉදිරි පිටුවල ද සකස් කළ යුතු ය. අයදුම්පත් යතුරු ලියනයක ආධාරයෙන් පිළියෙල කරගත හැකි නමුදු අයදුම්කරුවන්ගේම අත් අකුරින් මෙහි දක්වෙන උපදෙස් පරිදි නිවැරදිව හා පැහැදිලිව සම්පූර්ණ කළ යුතු ය.

* අයදුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම, සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු ය.

* අයදුම්පත් පිටපත් දෙකකින් සම්පූර්ණ කළ යුතු ය. එක් පිටපතක් තමාගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇතුළත් කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් වෙත ද, මුල් පිටපත විභාග කොමසාරිස් ජනරාල් වෙත ද එවිය යුතු ය.

* සියලුම විභාග අපේක්ෂකයින් තම අයදුම්පත් තමා සේවය කරන වසම අයත් ප්‍රාදේශීය ලේකම් මගින්, විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් 2016 සැප්තැම්බර් 26 දින හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතු ය.

* අයදුම්පත්‍ර එවනු ලබන කවරයේ ඉහළ වම් කෙළවරේ ''ග්‍රාම නිලධාරී සේවාවේ අධි ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරග විභාගය - 2016'' යනුවෙන් සඳහන් කළ යුතු ය. අයදුම්පත් බාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

* අයදුම්පත්‍රයට කිසිම ලියවිල්ලක් හෝ ලියවිල්ලක පිටපතක් හෝ නොඇමිණිය යුතු ය. එතෙකුදු වුවත් තමන් සඳහන් කරන, එමෙන්ම තමන්ගේ සුදුසුකම් සනාථ කරන ලියවිලි ඉල්ලූ අවස්ථාවක ඉදිරිපත් කිරීම සඳහා සූදානමින් තබාගත යුතු ය.

07. විභාග ගාස්තු :

* විභාග ගාස්තුව රු. 500 කි. මෙම ගාස්තු විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 යටතේ රජයේ ආදායමට බැර වන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පතේ නිසි කොටුවෙහි එහි දාරයකින් අලවා ලදුපත් අංකය, දිනය හා තැපැල් කාර්යාලය සඳහන් කර තිබිය යුතු ය. එම ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කිසිදු හේතුවක් නිසාවත් ගාස්තු ආපසු ගෙවනු නොලබයි. විභාග ගාස්තු ගෙවීම සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර, එවැනි අයදුම්පත් කිසිම දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

* 2011 වර්ෂයේ දී පැවැත්වීමට නියමිතව තිබූ ග්‍රාම නිලධාරී සේවාවේ අධිශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරග විභාගය සඳහා නියමිත විභාග ගාස්තුව ගෙවා අයදුම් කර ඇති නිලධාරීන් මෙවර විභාගයට පෙනී සිටින්නේ නම් ගාස්තුව 2016 වර්ෂයේ විභාගය සඳහා වලංගු කරනු ලැබේ. එම නිලධාරීන් විසින් 2011 වර්ෂයේ දී මුදල් ගෙවා ලබාගත් ලදුපතේ ඡායා පිටපතක් ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ අලවා තිබිය යුතු ය.

08.

i. *විභාගයට ඇතුළත් කර ගැනීම* -

* නිවැරදිව අයදුම්පත් ඉදිරිපත් කර ඇති සියලුම අපේක්ෂකයින්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගය පවත්වනු ලබන දිනය දන්වමින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. විභාගයට පෙනී සිටින අපේක්ෂකයින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතු ය. ප්‍රවේශපත්‍ර නොමැතිව ඔවුන්ට විභාග ශාලාවට ඇතුලුවීමට හෝ විභාගයට පෙනී සිටීමට අවසර නොලැබෙනු ඇත.

* විභාගයට ආරම්භවන දිනයේ විභාග ශාලාධිපති වෙත, තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

* සියලුම විභාග අපේක්ෂකයින් රජයේ *ගැසට්* පත්‍රයේ පළකරන ලද විභාග නීතිරීති පිළිබඳව අවබෝධයක් ලබා සිටිය යුතු අතර, ඒවා පිළිපැදීමට බැඳී සිටිය යුතු ය.

* විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශපත්‍ර ඇති අපේක්ෂකයින්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් රාජකාරි නිවාඩු දෙනු ලැබේ.

* *හැඳුනුම්පත්*.-අපේක්ෂකයින් විසින් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම විභාග ශාලාධිපතිට ඒත්තු යන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පුකළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතරින් කුමක් වුවත් භාරගනු ලැබේ. :-

  * පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,

  * වලංගු විදේශ ගමන් බලපත්‍රය.

(ii) *විභාග ප්‍රතිඵල* :-

මෙම නිවේදනයේ 02 ඡේදයේ සඳහන් පරිදි ලිඛිත පරීක්ෂණයෙන් එක් එක් විෂයයට ලකුණු 40% කට නොඅඩුව ලබා ගන්නා අපේක්ෂකයින්ගේ, පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක ලේඛනයක් ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියළුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ පලකරනු ඇත.

09. (i) විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනයේ සඳහන්, විභාගය පැවැත්වෙන දිනයට අවම වශයෙන් දින පහකටවත් පෙර තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙක් වේ නම් දැන්වීමෙහි සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතු ය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙක් නම්, එම විස්තර සමඟ ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද

සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

(ii) අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකේ.

10. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ උපදෙස් පිළිපැදීමට අපේක්ෂකයින් යටත් වේ.

11. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

නීල් ද අල්විස්,
ලේකම්,
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2016 අගෝස්තු මස 08 වැනි දින,
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

ආදර්ශ අයදුම්පත්‍රය

| |
|---|
| |

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

**ග්‍රාම නිලධාරී සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරග විභාගය - 2016**

**Limited Competitive Examination for Promotion to Supra Grade of Grama Niladhari - 2016**

(අංක 01 සිට 05 දක්වා මුල් පිටුවේද, අංක 06 සිට ඉදිරි පිටුවලටද ඇතුලත් කල යුතුය)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය [ ]

සිංහල - 2

දෙමළ -3

[ ] සේවය කරන දිස්ත්‍රික්කය

[ ] දිස්ත්‍රික් අංකය

(උපලේඛන - අංක 02 අනුව අදාළ දිස්ත්‍රික්කය සහ දිස්ත්‍රික් අංකය කොටුව තුළ ලියන්න)

(අදාල අංකය කොටුව තුළ ලියන්න)

*විභාගයට පෙනී සිටින නගරය*

| | |
|---|---|
| | |
| | |

*නගර අංකය*

| | | |
|---|---|---|
| | | |

(උපලේඛන - අංක 01 අනුව නගරය හා නගර අංකය ඇතුළත් කරන්න)

1 වන කොටස
(*සැලකිය යුතුය* - ආකෘති පත්‍රය නිවැරදිව සහ පැහැදිලිව අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත් අකුරින්ම පිරවිය යුතුය.)

01. (i) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

(ii) අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොද නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : GUNAWARDHANA, H. M. S. K.)

(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. (i) රාජකාරි ලිපිනය :————.

(ii) ප්‍රවේශපත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

03. (i) ප්‍රදේශීය ලේකම් කොට්ඨාසය :————.

(ii) ග්‍රාම නිලධාරී වසම :————. අංකය : ☐ ☐ ☐

04. (i) ස්ත්‍රී පුරුෂ භාවය : ☐

පුරුෂ - 0 (අදාළ කොටුව තුළ අංකය සඳහන් කරන්න)
ස්ත්‍රී - 1

(ii) උපන් දිනය :

අවුරුද්ද :————. මාසය :————. දිනය :————.

(iii) ජාතික හැඳුනුම්පත් අංකය : ☐ ☐ ☐ ☐ ☐ ☐ ☐ ☐ ☐ ☐

05. (i) දැනට දරන තනතුරට පත්වූ දිනය/අන්තර්ග්‍රහනය කළ දිනය හා ලිපියේ යොමු අංකය. :————.

(ii) මුළු සේවා කාලය :

අවුරුදු :————. මාස :————. දින :————.

(iii) දැනට සිටින ශ්‍රේණිය :————.

එම ශ්‍රේණියේ සේවා කාලය : අවුරුදු :————. මාස :————. දින :————.

06. ග්‍රාම නිලධාරි සේවයට අන්තර්ග්‍රහනය කරන ලද නිලධාරියෙකු නම් ඒ පිළිබඳ විස්තර :
(අදාල ඡේදය පමණක් සම්පූර්ණ කරන්න)

(i) විශේෂ සේවා නිලධාරි සේවයට ඇතුළත් වූ දිනය :————.
සේවා කාලය :————.
(ii) වගා නිලධාරි සේවයට ඇතුළත් වූ දිනය :————.
සේවා කාලය :————.
(iii) කෘෂි ව්‍යාප්ති සේවයට ඇතුළත් වූ දිනය :————.
සේවා කාලය :————.
(iv) ඊට සමාන වෙනත් සේවාවකට ඇතුළත් වූ දිනය :————.
සේවා කාලය :————.

07. ඔබ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා ආදී ප්‍රවේශකයෙක්ද, නැතිනම් නව ප්‍රවේශකයෙක් ද ? :————.

08. (i) සේවා කාලය තුළ සියලුම වැටුප් වර්ධක ඔබ උපයාගෙන තිබේද ? :————.

(ii) එසේ නැතිනම් විස්තර සඳහන් කරන්න. :————.

09. සංස්ථාවක හෝ වෙනත් සේවාවකට සේවය සඳහා ඔබ දැනට මුදාහැර ඇත්නම් ඒ පිළිබඳ විස්තර සපයන්න. :————.

10. ඔබ විදේශ රැකියාවක් සඳහා හෝ වෙනත් කාර්යයක් සඳහා වැටුප් රහිත නිවාඩු ලබාගෙන ඇත්නම් විස්තර දක්වන්න :————.

11. ඔබට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගෙන තිබේ ද? ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න. :————.

***සැළකිය යුතුයි*** :- *ගැසට් පත්‍රයේ දැක්වෙන පරිදි විභාග ගාස්තු සඳහා නියමිත මුදල් ගෙවූ බවට තැපැල් කාර්යාලයෙන් ලබාගත් කුවිතාන්සිය මෙහි නොගැලවෙනසේ ඇලවිය යුතුය.*

| ලදුපත නොගැලවෙනසේ එහි එක් දරයකින් මෙහි අලවන්න. |
|---|

කුවිතාන්සි අංකය :————.
තැපැල් කාර්යාලය :————.
දිනය :————.

මුදල ඃ රුපියල් :————.

………………… වන මා විසින්, ඉහත සඳහන් කර ඇති සියලුම තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. තව ද, මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයා ගනු ලැබුවහොත් මෙම සේවාවේ අධි ශ්‍රේණියට උසස්වීම පිළිබඳව වූ මගේ හිමිකම් නොසලකා හරිනු ලැබීමට ද, මට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබීමට ද හැකි බව මම හොඳාකාර දන්නා අතර, ඒ අනුව කටයුතු කිරීම ගැන මම විරුද්ධ නොවෙමි. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ නියෝගවලට අනුකූලව කටයුතු කිරීමට එකඟ වෙමි.

————,
නිලධාරියාගේ අත්සන

දිනය :————.

II වන කොටස

ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සම්පූර්ණ කළ යුතුය.

(i) .......................... මහතා/මහත්මිය/මෙනෙවිය ඉහත සපයා ඇති තොරතුරු, ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපිගොනුව සමග සසඳා බලන ලදුව ඒවා සත්‍ය හා නිවැරදි බවත්,

(ii) නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්,

(iii) ඔහුට/ඇයට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත්,

(iv) පූර්වාසන්න පස් වසර තුල ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායකව පැවැති බවත් .......... දින සිට ග්‍රාම නිලධාරී .......... වන ශ්‍රේණියට පත් කරනු ලැබ ඇති බවත්, මෙම ඉල්ලුම්පතේ පිටපත නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුවෙහි අමුණන ලද බවත් සහතික කරමි.

————,
ප්‍රාදේශීය ලේකම්

නම :————,
පදවි නාමය :————,
නිල මුද්‍රාව :————.
දිනය :————.

(නොගැලපෙන වචන කපා හරින්න)

උපලේඛනය - අංක 01

විභාගය පවත්වනු ලබන මධ්‍යස්ථාන

මෙම විභාගය කොළඹ, මහනුවර, ගාල්ල, මාතර, යාපනය, මන්නාරම, මුලතිවු, ත්‍රිකුණාමලය, මඩකලපුව, කුරුණෑගල, අනුරාධපුරය, බදුල්ල, රත්නපුර, හා කිලිනොච්චිය යන නගරවලදී පැවැත්වේ. අදාල නගර හා නගර අංක පහත වගුවේ දැක්වේ. ඉල්ලුම්පත්‍රයේ අදාල ශීර්ෂය මෙම නගර හා නගර අංක සඳහන් වගුව අනුව සම්පූර්ණ කළ යුතුවේ. ඉල්ලුම්කළ නගරය/නගර පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කොළඹ | 001 |
| මහනුවර | 002 |
| ගාල්ල | 003 |
| මාතර | 004 |
| යාපනය | 005 |
| මන්නාරම | 006 |
| මුලතිවු | 007 |
| ත්‍රිකුණාමලය | 008 |
| මඩකලපුව | 009 |
| කුරුණෑගල | 010 |
| අනුරාධපුර | 011 |
| බදුල්ල | 012 |
| රත්නපුර | 013 |
| කිලිනොච්චිය | 014 |

ඉහත සඳහන් යම්කිසි මධ්‍යස්ථානයක් සඳහා ප්‍රමාණවත් අපේක්ෂකයින් සංඛ්‍යාවක් නොමැති වුවහොත් එම මධ්‍යස්ථානය අවලංගු කර, ඊට ආසන්න මධ්‍යස්ථානයක් වෙත අදාළ අයැදුම්කරුවන් යොමු කරනු ඇත.

උපලේඛන අංක 02

දිස්ත්‍රික් අංක ලැයිස්තුව

| අංකය | දිස්ත්‍රික්කය | දිස්ත්‍රික් අංකය |
|---|---|---|
| 1 | කොළඹ | 001 |
| 2 | ගම්පහ | 002 |
| 3 | කළුතර | 003 |
| 4 | මහනුවර | 004 |
| 5 | මාතලේ | 005 |
| 6 | ගාල්ල | 006 |
| 7 | මාතර | 007 |
| 8 | හම්බන්තොට | 008 |
| 9 | කුරුණෑගල | 009 |
| 10 | පුත්තලම | 010 |
| 11 | නුවරඑළිය | 011 |
| 12 | රත්නපුර | 012 |
| 13 | බදුල්ල | 013 |
| 14 | මොණරාගල | 014 |
| 15 | කෑගල්ල | 015 |
| 16 | අනුරාධපුර | 016 |
| 17 | පොලොන්නරුව | 017 |
| 18 | අම්පාර | 018 |
| 19 | මඩකලපුව | 019 |
| 20 | ත්‍රිකුණාමලය | 020 |
| 21 | යාපනය | 021 |
| 22 | වවුනියාව | 022 |
| 23 | මන්නාරම | 023 |
| 24 | කිලිනොච්චිය | 024 |
| 25 | මුලතිවු | 025 |

08-665/1

---

**ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර අධිපන්තියට අයත් පරිපාලන ග්‍රාම නිලධාරි තනතුර සඳහා කුසලතා පදනම මත බඳවා ගැනීම සඳහා වන ලිඛිත තරග විභාගය - 2016**

## Competitive Examination for the Promotion to Supra Grade of Grama Niladhari Merit Basis - 2016

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි ග්‍රාම නිලධාරි සේවයට අයත් පහත 5 වන වගන්තියේ සඳහන් සුදුසුකම් ඇති ග්‍රාම නිලධාරින් එම සේවයේ අධි ශ්‍රේණියට කුසලතා මත උසස් කිරීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. අදල විභාග පවත්වනු ලබන මධ්‍යස්ථාන සහ මධ්‍යස්ථාන අංක සඳහන් ලැයිස්තුව, උපලේඛන අංක 01 වශයෙන් ද, දිස්ත්‍රික් අංක ලැයිස්තුව, උපලේඛන අංක 02 වශයෙන් ද, මෙම නිවේදනයේ අවසානයේ අමුණා ඇත.

*උසස් කිරීමේ නියමයන්*.-ලිඛිත තරග විභාගයෙහි ලකුණු හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාවය පදනම් කරගෙන ගණනය කරනු ලබන ලකුණුවල එකතුවෙහි අනුපිළිවෙල අනුව කුසලතා පදනමින් පිරවිය යුතු පරිපාලන ග්‍රාම නිලධාරි තනතුරෙහි පුරප්පාඩු 71ක් සඳහා බඳවා ගනු ලැබේ.

02. **උසස් කිරීමේ ක්‍රමය** -

(i) මේ සඳහා ඉල්ලුම් කරන අයැදුම්කරුවන් සඳහා, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගයක් පවත්වනු ලබන අතර, මෙම විභාගයේ ප්‍රතිඵල මත ලබන ලකුණු හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන තිදෙනෙකුගෙන් යුත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින්, ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාවය පදනම් කරගෙන ගණනය

කරනු ලබන ලකුණුවල එකතුවේ අනුපිළිවෙල අනුව ප්‍රමුඛත්වය තීරණය කරනු ලැබේ.

(ii) ලිඛිත විභාගයේ දී ලබා ගත් ලකුණු සංඛ්‍යාව අනුව සකස් කරනු ලබන ප්‍රමුඛතා ලේඛනයකින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක අයදුම්කරුවන් ප්‍රමාණයක් සම්මුඛ පරීක්‍ෂණයට කැඳවීම සඳහා සුදුසුකම් ලබයි.

(iii) අධි ශ්‍රේණියට පත් කරනු ලබන නිලධාරීන් සේවා ස්ථානවලට අනුයුක්ත කිරීමේදී පළමුව පවත්නා පුරප්පාඩු වලට ස්ථාන මාරුවීම් මගින් දනට සිටින නිලධාරීන්ට ස්ථාන මාරුවීමට අවස්ථාව ලබා දෙන අතර, එම ස්ථාන මාරු ලබා දීමෙන් පසු දිස්ත්‍රික්කය තුළ ඉතිරිවන පුරප්පාඩු වලින් 60% සඳහා විභාගයේදී ලබන ජ්‍යෙෂ්ඨත්වය මත සේවයේ යෙදී සිටින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් බැහැර, දිස්ත්‍රික්කය තුළ වෙනත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට අනුයුක්ත කරන අතර, දිස්ත්‍රික්කය තුළ පවත්නා එම පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි ප්‍රමාණයක් සුදුසුකම් ලබා ඇති අවස්ථාවන්හිදී, එම අය දිස්ත්‍රික්කයෙන් පිටත පවත්නා පුරප්පාඩු සඳහා අනුයුක්ත කරනු ඇත. එසේ අනුයුක්ත කරනු ලබන ස්ථානවල පත්වීම් භාර නොගන්නා අයගේ පත්වීම් අවලංගු කරන අතර, එවැනි අයකුට පසු අවස්ථාවකදී එම පත්වීම් සඳහා මෙම විභාගයේ ප්‍රතිඵල මත නැවත ඉල්ලීමක් කිරීමට හිමිකම් නොලබනු ඇත.

(iv) මෙම විභාගය පවත්වනු ලබන්නේ සිංහල හා දෙමළ මාධ්‍යවලින් පමණක් වන අතර, ඉල්ලුම්කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

03. (i) *විභාග පරිපාටිය* - අයදුම්කරුවන් අභියෝග්‍යතාව හා විෂයානුබද්ධ අධ්‍යයනය යන විෂයයට පෙනී සිටිය යුතුය. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා කාලය පැය 01 1/2 ක් වන අතර, සුදුසුකම් ලැබීමට අවම වශයෙන් මුළු ලකුණු 100න් 40ක් ලබාගත යුතු ය.

(ii) *විෂයය නිර්දේශය* :

කාර්යාල පරිපාලනයට හා ග්‍රාම නිලධාරීන්ට පැවරී ඇති රාජකාරි විෂයන්ට සම්බන්ධ කටයුතු ඉටුකිරීමේදී අවශ්‍ය වන සාමාන්‍ය දැනීම, තීරණ ගැනීමේ හැකියාව, තාර්කික විසඳීම හා කාර්යාල පරිපාලනය පිළිබඳ දැනුම අපේක්ෂා කෙරේ.

04. *ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාවය මැනීම සඳහා ලකුණු ලබාදීමේ ක්ෂේත්‍ර*

(i) ජ්‍යෙෂ්ඨත්වය — උපරිම ලකුණු 60

1 වන ශ්‍රේණියේ වසර 05කට වඩා සේවය කර ඇති, එක් වසරක සතුටුදායක සේවා කාලයක් සඳහා ලකුණු 04 බැගින්, (මාස 06-12 අතර කාලයක් සඳහා ලකුණු 02යි. මාස 06ට අඩු කාලයකට ලකුණු නොලැබේ.)

(ii) *කුසලතාවය* — උපරිම ලකුණු 35

(ii-i) I වන ශ්‍රේණියට පත්වීමෙන් පසු ලබා ඇති කීර්ති ප්‍රශංසා සඳහා — උපරිම ලකුණු 15

පොදු ආකෘති 230බී, මඟින් ලබාදී ඇති කීර්ති ප්‍රශංසා, එක් සහතිකයක් සඳහා ලකුණු 03 බැගින් හා පොදු 230 බී ආකෘතියෙන් බැහැරව ලබාදී ඇති කීර්ති ප්‍රශංසා, එක් සහතිකයක් සඳහා ලකුණු 01 බැගින්

(ii-ii) *ග්‍රාම නිලධාරි කාර්යාල කළමනාකරණ තරගයෙන් ලද ජයග්‍රහණ සඳහා — උපරිම ලකුණු 20*

- සමස්ත ලංකා පළමු ස්ථානය — ලකුණු 15
- සමස්ත ලංකා දෙවන ස්ථානය — ලකුණු 12
- සමස්ත ලංකා තෙවන ස්ථානය — ලකුණු 10
- දිස්ත්‍රික් තරගයේ පළමු ස්ථානය — ලකුණු 08
- දිස්ත්‍රික් තරගයේ දෙවන ස්ථානය — ලකුණු 06
- දිස්ත්‍රික් තරගයේ තෙවන ස්ථානය — ලකුණු 04
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පළමු ස්ථානය — ලකුණු 03
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දෙවන ස්ථානය — ලකුණු 02
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තෙවන ස්ථානය — ලකුණු 01

(එක් වර්ෂයකදී එක් එක් මට්ටමෙන් ලබා ඇති ජයග්‍රහණය අතුරින්, ඉහළම ජයග්‍රහණය සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.)

(iii) සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය උපරිම ලකුණු 05

05. සුදුසුකම් : අයදුම්පත් බාරගන්නා අවසාන දිනට අපේක්ෂකයින් පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණකර තිබිය යුතුය.

(i) ග්‍රාම නිලධාරි 1 වන ශ්‍රේණියේ වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර හා නියමිත කාර්යක්ෂමතා කඩඉම් සමත්වී තිබිය යුතුය.

(ii) අවසාන වසර 05 හි වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතුය.

06. වැටුප් ක්‍රමය :

(i) වැටුප් කේත අංකය : MN 7-2016 (රු. 41,580-11x755-18x1,030 - රු. 68,425)

(මෙම වැටුප් පරිමාණය අනුව වැටුප් සකස් කිරීමේදී 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි විධිවිධාන අදාළ වේ.)

(ii) උසස් කරනු ලබන නිලධාරින් මෙම වැටුප් පරිමාණයේ වැටුප් පියවරෙහි පිහිටුවනු ලබන්නේ ආයතන සංග්‍රහයේ vii වන පරිච්ඡේදයේ 5 වන වගන්තිය සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 11/94 හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 7/2000 න් කරන ලද සංශෝධනවලට අනුකූලවය.

07. අයදුම්පත් භාර ගැනීම :

(i) මෙම විභාගය සඳහා අයදුම් කිරීමේ ආදර්ශ අයදුම්පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ පළකර ඇත. අයදුම්පත සකස් කිරීමේදී, ශීර්ෂයේ සඳහන් විභාගයේ නම, සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද යෙදිය යුතුය. ආදර්ශ අයදුම්පතට අනුකූලව පමණක් අයදුම්කරුවන් හෝ අයදුම්කාරියන් විසින් තමන්ගේ අයදුම්පත් පිළියෙල කර ගැනීම අවශ්‍ය වේ. අයදුම්පත් A4 කඩදාසියක දෙපැත්ත භාවිතයට ගනිමින් පිළියෙල කළ යුතුය. අංක 01 සිට 05 දක්වා එහි මුල් පිටුවේ ද, ඉතිරි කොටස් ඉතිරි පිටුවල ද සකස් කළ යුතුය. අයදුම්පත් යතුරු ලියනයක ආධාරයෙන් පිළියෙල කරගත හැකි නමුදු අයදුම්කරු තමන්ගේම අත් අකුරින් මෙහි දැක්වෙන උපදෙස් පරිදි නිවැරිදිව හා පැහැදිලිව සම්පූර්ණ කළ යුතුය.

(ii) අයදුම්පත් පිටපත් දෙකකින් සම්පූර්ණ කළ යුතුය. එක් පිටපතක් තමාගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇතුළත් කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් වෙත ද, අනෙක් පිටපත විභාග කොමසාරිස් ජනරාල් වෙත ද එවිය යුතුය.

(iii) සියලුම විභාග අපේක්ෂකයින් තම අයදුම්පත් තමා සේවය කරන වසම අයත් ප්‍රාදේශීය ලේකම් මඟින්, විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් 2016 සැප්තැම්බර් 26 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය.

(iv) අයදුම්පත්‍ර එවනු ලබන කවරයේ ඉහල වම් කෙළවරේ ''කුසලතා මත ග්‍රාම නිලධාරි අධි ශ්‍රේණියට උසස් කිරීමේ තරඟ විභාගය - 2016'' යනුවෙන් සඳහන් කළ යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

(v) අයදුම්පත්‍රයට කිසිම ලියවිල්ලක් හෝ ලියවිල්ලක පිටපතක් හෝ නොඇමිණිය යුතුය. එසේකුදු වුවත් තමන් සඳහන් කරන එමෙන්ම තමන්ගේ සුදුසුකම් සනාථ කරන ලියවිලි ඉල්ලූ අවස්ථාවක ඉදිරිපත් කිරීම සඳහා සූදානමින් තබාගත යුතුය.

08. විභාග ගාස්තු :

විභාග ගාස්තුව රු. 500 කි. මෙම ගාස්තු විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 යටතේ රජයේ ආදායමට බැර වන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලක් වෙත මුදලින් ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පතේ නිසි කොටුවෙහි එහි දාරයකින් අලවා ලදුපත් අංකය, දිනය හා තැපැල් කාර්යාලය සඳහන් කර තිබිය යුතුය. එම ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කිසිදු හේතුවක් නිසාවත් ගාස්තු ආපසු ගෙවනු නොලබයි. විභාග ගාස්තු ගෙවීම සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර, එවැනි අයදුම්පත් කිසිම දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

09. විභාගයට ඇතුළත් කර ගැනීම :

(i) නිවැරදිව අයදුම්පත් ඉදිරිපත් කර ඇති සියලුම අපේක්ෂකයින්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගය පවත්වනු ලබන දිනය දන්වමින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. විභාගයට පෙනී සිටින අපේක්ෂකයින් විභාගය ආරම්භ වන දිනයේ තම අත්සන සහතික කරගත් ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශපත්‍ර නොමැතිව ඔවුන්ට විභාග ශාලාවට ඇතුලුවීමට හෝ විභාගයට පෙනී සිටීමට අවසර නොදෙනු ඇත.

(ii) අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකේ.

(iii) සියලුම අපේක්ෂකයින් විභාගය පැවැත්වීම සම්බන්ධයෙන්, විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත්, විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

(iv) විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශපත්‍ර ඇති අපේක්ෂකයින්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් රාජකාරි නිවාඩු දෙනු ලැබේ. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

(v) හැඳුනුම්පත් : අපේක්ෂකයින් විසින් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයක් පාසාම විභාග ශාලාධිපතිට ඒත්තු යන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පුකළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි පමණක් බාරගනු ලැබේ.

* පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත්‍රය,
* වලංගු විදේශ ගමන් බලපත්‍රය.

(vi) විභාග ප්‍රතිඵල :

නිවේදනයේ 03 ඡේදය අනුව ලිඛිත පරීක්ෂණය සමත්වන අයදුම්කරුවන්ගේ ලේඛනය ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ලබා දෙනු ඇත. අදාළ කුසලතා ලකුණු ලැබීමෙන් අනතුරුව ලිඛිත පරීක්ෂණයේ හා කුසලතා ලකුණුවලට මුළු ලකුණු ප්‍රමුඛතාව අනුව සකස් කළ අවසන් ප්‍රතිඵල ලේඛනය ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ලබාදෙනු ඇත. ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ දැනුම්දීම පරිදි විභාගයට පෙනී සිටි සියළුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව තැපැල් කිරීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ පළ කිරීම සිදු කරනු ඇත.

10. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

විසින් පළ කරනු ඇත. නිවේදනයේ සඳහන්, විභාගය පැවැත්වෙන දිනයට අවම වශයෙන් දින පහකටවත් පෙර තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙක් වේ නම් දැන්වීමෙහි සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙක් නම්, එම විස්තර සමග ෆැක්ස් මඟින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකය ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සුදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

11. සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සළකා කටයුතු කරනු ලැබේ.

නීල් ද අල්විස්,
ලේකම්,
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2016 අගෝස්තු මස 08 දින,
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

| |
|---|
| |

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

ආදර්ශ අයදුම්පත්‍රය

**කුසලතා මත ග්‍රාම නිලධාරී සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීමේ තරග විභාගය - 2016**

**Competitive Examination for the Promotion to Supra Grade of Grama Niladhari Merit Basis - 2016**

(අංක 01 සිට 05 දක්වා මුල් පිටුවේ ද, අංක 06 සිට ඉදිරි පිටුවලටද ඇතුළත් කළ යුතුය)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය [ ]　　[ ] සේවය කරන දිස්ත්‍රික්කය　　[ ] දිස්ත්‍රික් අංකය

සිංහල - 2

දෙමළ -3

(උපලේඛන - අංක 02 අනුව අදාළ දිස්ත්‍රික්කය සහ දිස්ත්‍රික් අංකය කොටුව තුළ ලියන්න)

(අදාල අංකය කොටුව තුළ ලියන්න)

*විභාගයට පෙනී සිටින නගරය*

| | |
|---|---|
| | |
| | |

*නගර අංකය*

| | | |
|---|---|---|
| | | |

(උපලේඛන - අංක 01 අනුව නගරය හා නගර අංකය ඇතුළත් කරන්න)

I වන කොටස

(*සැලකිය යුතුය* - ආකෘති පත්‍රය නිවැරදිව සහ පැහැදිලිව අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත් අකුරින්ම පිරවිය යුතුය.)

01. (i) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(*උදා :* HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

(ii) අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(*උදා :* GUNAWARDHANA H. M. S. K.)

(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. (i) රාජකාරි ලිපිනය :————.

(ii) ප්‍රවේශපත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

03. (i) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.
(ii) ග්‍රාම නිලධාරී වසම හා අංකය :————.

04. (i) ස්ත්‍රී පුරුෂ භාවය ඃ ☐

පුරුෂ - 0 (අදාළ කොටුවෙහි අංකය සඳහන් කරන්න)
ස්ත්‍රී - 1

(ii) උපන් දිනය ඃ

අවුරුද්ද :————. මාසය :————. දිනය :————.

(iii) ජාතික හැඳුනුම්පත් අංකය ඃ ☐ ☐ ☐ ☐ ☐ ☐ ☐ ☐ ☐ ☐

05. (i) දැනට දරන තනතුරට පත්වූ දිනය/අන්තර් ග්‍රහනය කල දිනය හා ලිපියේ යොමු අංකය. :————.

(ii) සේවා කාලය ඃ

අවුරුදු :————. මාස :————. දින :————.

06. ග්‍රාම නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කරන ලද නිලධාරියෙකු නම් ඒ පිළිබඳ විස්තර ඃ
(අදාල ඡේදය පමණක් සම්පූර්ණ කරන්න)

(i) විශේෂ සේවා නිලධාරී සේවයට ඇතුළත් වූ දිනය :————.
සේවා කාලය :————.
(ii) වගා නිලධාරී සේවයට ඇතුළත් වූ දිනය :————.
සේවා කාලය :————.
(iii) කෘෂි ව්‍යාප්ති සේවයට ඇතුළත් වූ දිනය :————.
සේවා කාලය :————.
(iv) ඊට සමාන වෙනත් සේවාවකට ඇතුළත් වූ දිනය :————.
සේවා කාලය :————.

07. ඔබ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා ආදී ප්‍රවේශකයෙක් ද, නැතිනම් නව ප්‍රවේශකයෙක් ද ? :————.

08. (i) සේවා කාලය තුළ සියලුම වැටුප් වර්ධක ඔබ උපයාගෙන තිබේ ද ? :————.

(ii) එසේ නැතිනම් විස්තර සඳහන් කරන්න. :————.

09. සංස්ථාවක හෝ වෙනත් සේවාවකට සේවය සඳහා ඔබ දැනට මුදාහැර ඇත්නම් ඒ පිළිබඳ විස්තර සපයන්න. :————.

10. ඔබ විදේශ රැකියාවක් සඳහා හෝ වෙනත් කාර්යයක් සඳහා වැටුප් රහිත නිවාඩු ලබාගෙන ඇත්නම් විස්තර දක්වන්න :————.

11. ඔබට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගෙන තිබේ ද? ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න. :————.

*සැළකිය යුතුයි :- ගැසට් පත්‍රයේ* දැක්වෙන පරිදි විභාග ගාස්තු සඳහා නියමිත මුදල් ගෙවූ බවට තැපැල් කාර්යාලයෙන් ලබාගත් කුවිතාන්සිය මෙහි නොගැලවෙනසේ ඇලවිය යුතුය.

| ලදුපත නොගැලවෙන සේ එහි එක් දාරයක් මගින් මෙහි අලවන්න |
|---|

කුවිතාන්සි අංකය :————.
තැපැල් කාර්යාලය :————.
දිනය :————.

මුදල ඃ රුපියල් :————.

................................. වන මා විසින්, ඉහත සඳහන් කර ඇති සියලුම තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. තව ද, මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයා ගනු ලැබුවහොත් මෙම සේවාවේ අධි ශ්‍රේණියට උසස්වීම පිළිබඳව වූ මගේ හිමිකම් නොසලකා හරිනු ලැබීමට ද, මට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබීමට ද හැකි බව මම හොඳාකාර දන්නා අතර, ඒ අනුව කටයුතු කිරීම ගැන මම විරුද්ධ නොවෙමි. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ නියෝගවලට අනුකූලව කටයුතු කිරීමට එකඟ වෙමි.

————,
නිලධාරියාගේ අත්සන.

දිනය :————.

II වන කොටස

ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සම්පූර්ණ කළ යුතු ය.

(i) .......................... මහතා/මහත්මිය/මෙනවිය ඉහත සපයා ඇති තොරතුරු, ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපිගොනුව සමඟ සසඳා බලන ලදුව ඒවා සත්‍ය හා නිවැරදි බවත්,

(ii) නියමිත විභාග ගාස්තුව ගෙවන ලද ලදුපත අලවා ඇති බවත්,

(iii) ඔහුට/ඇයට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත්,

(iv) පූර්වාසන්න පස් වසර තුළ ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායකව පැවති බවත් .......... දින සිට ග්‍රාම නිලධාරී I වන ශ්‍රේණියට පත් කරනු ලැබ ඇති බවත්, මේ සමඟ ඉදිරිපත් කර ඇති ඉල්ලුම්පතේ පිටපත නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුවෙහි අමුණන ලද බවත් සහතික කරමි.

————,
ප්‍රාදේශීය ලේකම්

නම :————.
පදවි නාමය :————.
නිල මුද්‍රාව :————.
දිනය :————.

(නොගැලපෙන වචන කපා හරින්න)

උපලේඛනය - අංක 01

විභාගය පවත්වනු ලබන මධ්‍යස්ථාන

මෙම විභාගය කොළඹ, මහනුවර, ගාල්ල, මාතර, යාපනය, මන්නාරම, මුලතිවු, ත්‍රිකුණාමලය, මඩකලපුව, කුරුණෑගල, අනුරාධපුරය, බදුල්ල, රත්නපුර, හා කිලිනොච්චිය යන නගරවලදී පැවැත්වේ. අදාළ නගර හා නගර අංක පහත වගුවේ දැක්වේ. ඉල්ලුම්පත්‍රයේ අදාළ ශීර්ෂය මෙම නගර හා නගර අංක සඳහන් වගුව අනුව සම්පූර්ණ කළ යුතුවේ. ඉල්ලුම්කළ නගරය/නගර පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කොළඹ | 001 |
| මහනුවර | 002 |
| ගාල්ල | 003 |
| මාතර | 004 |
| යාපනය | 005 |
| මන්නාරම | 006 |
| මුලතිවු | 007 |
| ත්‍රිකුණාමලය | 008 |
| මඩකලපුව | 009 |
| කුරුණෑගල | 010 |
| අනුරාධපුර | 011 |
| බදුල්ල | 012 |
| රත්නපුර | 013 |
| කිලිනොච්චිය | 014 |

ඉහත සඳහන් යම්කිසි මධ්‍යස්ථානයක් සඳහා ප්‍රමාණවත් අපේක්ෂකයින් සංඛ්‍යාවක් නොමැති වුවහොත් එම මධ්‍යස්ථානය අවලංගු කර, ඊට ආසන්න මධ්‍යස්ථානයක් වෙත අදාළ අයදුම්කරුවන් යොමු කරනු ඇත. තව ද යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සඛ්‍යාවක් අයදුම්කොට නොමැති නම් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

උපලේඛනය - අංක 02

දිස්ත්‍රික් අංක ලැයිස්තුව

| *අංකය* | *දිස්ත්‍රික්කය* | *දිස්ත්‍රික් අංකය* |
|---|---|---|
| 1 | කොළඹ | 001 |
| 2 | ගම්පහ | 002 |
| 3 | කළුතර | 003 |
| 4 | මහනුවර | 004 |
| 5 | මාතලේ | 005 |
| 6 | ගාල්ල | 006 |
| 7 | මාතර | 007 |
| 8 | හම්බන්තොට | 008 |
| 9 | කුරුණෑගල | 009 |
| 10 | පුත්තලම | 010 |
| 11 | නුවරඑළිය | 011 |
| 12 | රත්නපුර | 012 |
| 13 | බදුල්ල | 013 |
| 14 | මොණරාගල | 014 |
| 15 | කෑගල්ල | 015 |
| 16 | අනුරාධපුර | 016 |
| 17 | පොලොන්නරුව | 017 |
| 18 | අම්පාර | 018 |
| 19 | මඩකලපුව | 019 |
| 20 | ත්‍රිකුණාමලය | 020 |
| 21 | යාපනය | 021 |
| 22 | වවුනියාව | 022 |
| 23 | මන්නාරම | 023 |
| 24 | කිලිනොච්චිය | 024 |
| 25 | මුලතිවු | 025 |

08-665/2

---

## නිවැරදි කිරීමයි

### *ශ්‍රී ලංකා පොලීසිය*

සහකාර පොලිස් අධිකාරී තනතුරට ඉදුරාම බඳවා ගැනීම සඳහාවන විවෘත තරග විභාගය - 2015

2015.06.12 වැනි දින පළ කරන ලද අංක 1919 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* 06-265 නිවේදනයේ,

11.1 විවෘත තරග විභාගය කොටසේ,
11.1.4 අනු ඡේදය යටතේ,

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂයය නිර්දේශය* |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | ප්‍රශ්න 60ක් දෙනු ලැබේ.<br>බහුවරණ මාදිලියේ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය. |

ලෙසට මුද්‍රණ දෝෂයකින් පළ වී ඇත.

එම කොටස,

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂයය නිර්දේශය* |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | ප්‍රශ්න 50ක් දෙනු ලැබේ. බහුවරණ මාදිලියේ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය. |

ලෙසට නිවැරදි විය යුතුය.

පොලිස්පති,
පොලිස් මූලස්ථානය.

2016 අගෝස්තු මස 16 වැනි දින,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

08-820

---

**සංශෝධනයයි**

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය

***ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ III ශ්‍රේණියේ පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2015***

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1972 හා 2016.06.17 වැනි දිනැති *ගැසට් පත්‍රයේ* I කොටස (IIඅ) ඡේදයෙහි විභාග, විභාග ප්‍රතිඵල ආදිය යටතේ ඉහත මාතෘකාවෙන් පළකරන ලද්දා වූ විභාග නිවේදනයේ අංක 5 වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ. ඒ අනුව එම නිවේදනයේ පළමු ඡේදය අවසානයේ (අ) යටතේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2016.09.26 වේ.

**වයස් සීමාව :**

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 22ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 36ට නොවැඩි විය යුතුය.

02. තව ද, අංක 3 වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලබන අතර, මෙහි සඳහන් සංශෝධනයන් හැර උක්ත බඳවාගැනීම් නිවේදනයේ සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

වැටුප් පරිමාණය :

2016.02.25 වැනි දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 47,615-10 x 1,335-8x1,630 - 17x2,170 - රු. 110,895- (SL-1-2016) වේ. ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

ජේ.ජේ. රත්නසිරි,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය,
2016 අගෝස්තු මස 10 වැනි දින.

08-717

### අධ්‍යාපන අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 3 වන පන්තියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016

අංක 1885/31 හා 2014.10.22 දිනැති ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 3 වන පන්තියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2016 දෙසැම්බර් මස කොළඹ දී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. මෙම විභාගයට අදළ විෂය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන අංක 1885/31 දරන 2014.10.22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ *ගැසට් පත්‍රයේ* පළ කර ඇත. අයදුම්කරුවන්ගේ පහසුව සඳහා එම විෂය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන පහත දක්වා ඇත.

(*අ*) *විභාග පටිපාටිය* .- කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ විෂයයන් පහත දැක්වේ.

(i) විෂය අංකය 01 - ආයතන සංග්‍රහයේ විධිවිධාන හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති :

ලකුණු 100 - කාලය පැය 02

(ii) විෂය අංකය 02 - පාසල්වල මුදල් පරිපාලනය හා මුදල් රෙගුලාසි :-

ලකුණු 100 - කාලය පැය 02

*විෂය නිර්දේශය* :-

(i) ආයතන සංග්‍රහයේ විධිවිධාන හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති - ආයතන සංග්‍රහයේ පරිච්ඡේද VII, VIII, IX, X, XI, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XL, XLVIII යන පරිච්ඡේද හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති පිළිබඳ දැනුම පරීක්ෂා කරනු ලැබේ.

(ii) පාසල්වල මුදල් පරිපාලනය හා මුදල් රෙගුලාසි :

අයවැය ඇස්තමේන්තු මුදල් පාලනය හා මූල්‍ය වගකීම් පැවරීම, මුදල් භාර ගැනීම ගිණුම්ගත කිරීම හා ප්‍රතිග්‍රහණය, ගෙවීම්, රාජ්‍ය මුදල් භාරකත්වය, අග්‍රිම හා බැංකු ගිණුම්, වැඩ හා සේවා, භාණ්ඩ සමීක්ෂණ, විගණන විමසුම්, රජයේ කාර්යාලවල භාවිත වන ලෙජර්, ආදයම් හා වියදම් සාරාංශ, බැංකු සැසඳුම්, නොගෙවූ චෙතන, රාජකාරි දුරකථන පිළිබඳ නිකුත් කර ඇති චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි පිළිබඳ සාමාන්‍ය අවබෝධය පරීක්ෂා කෙරේ.

03. සාමාර්ථය ලැබීම සඳහා අපේක්ෂකයෙකු ඉල්ලුම් කරන එක් එක් විෂයයකට අවම වශයෙන් 40% ක හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

04. *විභාගයේ භාෂා මාධ්‍යය*.-සිංහල හා දෙමළ (ඉල්ලුම් කරන ලද භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.)

05. යම්කිසි අපේක්ෂකයෙකුට තමන්ට හිමිකමක් නොමැති මාධ්‍යයකින් විභාගයට පෙනී සිටින බැව් අනාවරණය වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

5.1 විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ප්‍රතිඵල ලේඛනය ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබාදෙනු ඇත. විභාගාපේක්ෂකයින් වෙත පෞද්ගලික ප්‍රතිඵල ලේඛන නිකුත් කිරීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදු නොකරනු ඇත.

06. මෙම නිවේදනය අවසානයේ දැක්වෙන ආකෘතියට අනුව, ඉල්ලුම්පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 06 තෙක් පළමුවන පිටුවට ද ඉතිරිය දෙවන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතු අතර ඊට අදළ තොරතුරු තම අත්අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත්, දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති බව දන්වමි. තවද, සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුය. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප කරන බව වැඩි දුරටත් සඳහන් කරමි. ඉල්ලුම්පත්‍රය පිළියෙළ කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍ය බව දන්වමි.

07. විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගය පවත්වනු ලබන අතර, එය පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීති රීති පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති. විභාගය සඳහා වන නීති රීති මෙම නිවේදනය අවසානයේ පළ කොට ඇත.

08. ඉල්ලුම්පත් 2016 සැප්තැම්බර් මස 12 වැනි දින හෝ ඊට ප්‍රථම විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ ලිපිනයට ලැබෙන පරිදි කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් හෝ ඔබේ සේවා ප්‍රධානියා මගින් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මෙදිනට පසු එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

09. නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර විභාග ගාස්තු ගෙවීම අදළ නම් ඊට අදළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග

ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් ගත වූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. එසේ දැන්වීමේ දී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා අයදුම් කළ විභාගයේ නම සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර අයදුම්කරුවෙකු නම් එම විස්තර සමග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවිය හැකි ෆැක්ස් අංකයක් ද සහිත ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසීම වඩාත් ඵලදායී වේ. විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන අවස්ථාවේ අවශ්‍ය වුවහොත් අයදුම්කරුගේ අපේක්ෂකත්වය තහවුරු කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදළ වේ නම් ඒ සඳහා වූ ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදනමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

10. (i) අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී නියමිත විභාග අංකය යටතේ විභාග යට පෙනී සිටිය යුතුය. විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂකයෙකුම විභාගයේ පළමුවැනි දින තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාරදිය යුතුයි. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ii) ඉහත 08 ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයින්ගේ (පසුව ඉදිරිපත් කරනු ලබන) පැමිණිලි සලකා බලනු නොලැබේ.

11. විභාග ශාලාවේ දී තමන්ගේ අනන්‍යතාව තහවුරු කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කිරීම අපේක්ෂකයින්ගේ වගකීම වේ. ඒ සඳහා -

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ;

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ පමණක් පිළිගනු ලැබේ.

12. විභාග ගාස්තු :

(අ) මෙම විභාගය සඳහා අයකරන ලද ගාස්තු මොනයම් හේතුවක් මත හෝ ආපසු ගෙවනු නොලබන අතර වෙනත් විභාගයක ගාස්තුවකට මාරු කිරීමට ද ඉඩ දෙනු නොලැබේ.

(ආ) සම්පූර්ණ විභාගය හෝ ඉන් කොටසක් සඳහා හෝ පළමුවැනි වතාවේදී ගාස්තු අයකරනු නොලැබේ.

(ඇ) ඊට පසු එක් එක් වතාව සඳහා අය කෙරෙන ගාස්තු පහත දක්වේ.

| | | |
|---|---|---|
| සම්පූර්ණ විභාගය සඳහා | : | රු. 400 |
| එක් විෂයයක් සඳහා | : | රු. 200 |

මෙම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදයම් ශීර්ෂය 2003-02-13 ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා එවිය යුතුය. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලැබේ.

13. විභාග පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කලහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇති බව දන්වමි.

14. සිංහල හා දෙමළ භාෂා මාධ්‍යයන්ගෙන් පළවන නිවේදනයන්හි පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් පවතී නම් එහිදී සිංහල මාධ්‍යයෙන් වන නිවේදනය බලාත්මක වේ.

15. මෙම නිවේදනය මගින් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතුය.

ඩබ්. එම්. බන්දුසේන,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

පැලවත්ත, ඉසුරුපාය, අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

**ආදර්ශ ඉල්ලුම්පත්‍රය**

***ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 3 වන පන්තියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016***

Efficiency Bar Examination for officers in class, 3 in Sri Lanka Principals Service - 2016

(කොට්ඨාස හෝ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ වෙත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කරන්න. විභාගයේ නම කවරයේ වමත්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.)

1. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (අදළ අංකය කොටුව තුළ ලියන්න.)

සිංහල - 2

දෙමළ - 3

☐

2. (i) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
:-HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

(ii) අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොද නම
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උද :- GUNAWARDHANA H. M. S. K.)

(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

3. ලිපිනය :

(i) පෞද්ගලික :————.

(ii) රාජකාරී :————.

(iii) ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

(iv) දුරකථන අංකය : (රාජකාරී) :————.

4. (i) විදුහල්පති සේවයේ පන්තිය/ශ්‍රේණිය :————.

(ii) පාසල/කාර්යාලය :————.

(iii) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව/කලාප අධ්‍යාපන කාර්යාලය :————.

5. (i) ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | |

(ii) උපන් දිනය :

වර්ෂය | | | | |  මාසය | | |  දිනය | | |

(iii) ස්ත්‍රී / පුරුෂ භාවය : පුරුෂ - 0
ස්ත්‍රී - 1 ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

6. *ගැසට් නිවේදනයෙහි* 02 වන ඡේදයේ (අ) යටතේ දක්වා ඇති විෂය අංකය සහිතව අයදුම් කරනු ලබන විෂයයන් :

විෂය අංක 01 - ආයතන සංග්‍රහයේ විධිවිධාන හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති - ☐

විෂය අංකය 02 - පාසල්වල මුදල් පරිපාලනය හා මුදල් රෙගුලාසි ☐

අදාළ විෂයය අංකය/අංක කොටුව/කොටු තුළ ලියන්න.

7. විභාග ගාස්තු ගෙවා ලබාගත් ලදුපතේ විස්තර :

ලදුපත් අංකය :————.
තැපැල් කාර්යාලය :————.
දිනය :————.

ලදුපත මෙහි අලවන්න.

8. ඉහත සඳහන් තොරතුරු නිවැරදි බව ප්‍රකාශ කරමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මා එකඟ වෙමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

9. විභාග කොමසාරිස් ජනරාල්,

ඉහත විස්තර දක්වෙන අපේක්ෂකයා මගේ කොට්ඨාසයේ/ කලාපයේ/පළාතේ නිලධාරියෙකු බව සහතික කරමි. තව ද අපේක්ෂකයා විභාග ගාස්තුවෙන් නිදහස් බවද/අපේක්ෂකයා විභාග ගාස්තු සඳහා වන ලදුපත නිවැරදිව අලවා ඇති බවද සහතික කරමි.

————,
කොට්ඨාස හෝ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ/
අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ/
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සන.

ලිපිනය :————.
දිනය :————.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)
(අදළ නොවන වචන කපා හරින්න.)

08-811/2

---

**අධ්‍යාපන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2 වන පන්තියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය -2016

අංක 1885/31 හා 2014.10.22 දිනැති ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2 වන පන්තියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2016 ඔක්තෝබර් මස කොළඹදී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. මෙම විභාගයට අදාළ විෂය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන අංක 1885 / 31 දරන 2014.10.22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකර ඇත. අයදුම්කරුවන්ගේ පහසුව සඳහා එම විෂය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන පහත දක්වා ඇත.

(ඈ) විභාග පටිපාටිය - කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ විෂයයන් පහත දැක්වේ. ෑ

(i) විෂය අංක 01 - පාසල් පරිපාලනය හා අධීක්ෂණය - ලකුණු 100 - කාලය පැය 03

(ii) විෂය අංක 02 - පාසල් සැලසුම්කරණය - ලකුණු 100 - කාලය පැය 03

(iii) විෂය අංක 03 - අධ්‍යාපනයේ නව ප්‍රවණතා හා ව්‍යවහාර ලකුණු 100 - කාලය පැය 03

*විෂය නිර්දේශය ෑ*

(i) පාසල් පරිපාලනය හා අධීක්ෂණය ෑ
පාසලක යහපාලනය සඳහා විදුහල්පතිවරයෙකුගේ කාර්යයභාරය පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීම සඳහා ප්‍රශ්න ඇතුළත් කෙරේ. පාසල් කළමනාකරණ ක්‍රමවේද , කාලසටහන් සැකසීම, වගකීම් බෙදා දීම, පාසල් සංවර්ධනය සඳහා ජනතා සහභාගිත්වය, පාසල් පාදක කළමනාකරණය, පාසල් පාදක ගුරු සංවර්ධනය, ගුරු සුභසාධනය, ශිෂ්‍ය හිතකාමී පාසල් සංකල්පය, ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය යන ක්ෂේත්‍ර පිළිබඳ දැනුම මැන බැලේ.

(ii) පාසල් සැලසුම්කරණය ෑ
සංවර්ධනයේ නියමුවකු වශයෙන් විදුහල්පතිවරයෙකුගේ කාර්යයභාරය පිළිබඳව අපේක්ෂකයන්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීම සඳහා ප්‍රශ්න ඇතුළත් කරනු ලැබේ. පාසල් කළමනාකරණ මණ්ඩලය, පාසලක දැක්ම හා මෙහෙවර, පාසල් තොරතුරු පාදක සැකසීම, සංයුක්ත සැලසුම්, දීර්ඝ කාලීන හා කෙටි කාලීන සැලසුම්, වාර්ෂික ක්‍රියාත්මක සැලසුම්, පාසල් ජාල හා සම්පත් සැලසුම් කිරීම, ප්‍රාදේශීය සංවර්ධනයට පාසලේ දායකත්වය යන ක්ෂේත්‍ර පිළිබඳ දැනුම මැන බැලේ.

(iii) අධ්‍යාපනයේ නව ප්‍රවණතා හා ව්‍යවහාර ෑ
ඉගෙනීම හා ඉගැන්වීම් පිළිබඳ නව සංකල්පය, අත්දැකීමෙන් ඉගෙනීම, තර්කානුකූල චින්තනය, අධ්‍යාපනයේ සමතාව, විශේෂ අවශ්‍යතා ඇති අය සඳහා අධ්‍යාපනය, නොවිධිමත් අධ්‍යාපන, වැඩිහිටි අධ්‍යාපනය, යාවජීව අධ්‍යාපනය, නිපුණතා පාදක අධ්‍යාපනය, ජීවත් වීම සඳහා අධ්‍යාපනය, ශිෂ්‍ය උපදේශන හා වෘත්තීයමය මාර්ගෝපදේශනය යන විෂය කරුණු පිළිබඳ දැනුම මැන බැලේ.

03. සාමාර්ථය ලැබීම සඳහා අපේක්ෂකයෙකු ඉල්ලුම් කරන එක් එක් විෂයයකට අවම වශයෙන් 40 % ක හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතුය.

04. විභාගයේ භාෂා මාධ්‍යය - සිංහල හා දෙමළ (ඉල්ලුම් කරන ලද භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ)

05. යම්කිසි අපේක්ෂකයෙකුට තමන්ට හිමිකමක් නොමැති මාධ්‍යයකින් විභාගයට පෙනී සිටින බැව් අනාවරණය වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

5.1 විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ප්‍රතිඵල ලේඛනය ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබා දෙනු ඇත. විභාගාපේක්ෂකයින් වෙත පෞද්ගලික ප්‍රතිඵල ලේඛන නිකුත් කිරීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදු නොකරනු ඇත.

06. මෙම නිවේදනය අවසානයේ දැක්වෙන ආකෘතියට අනුව, ඉල්ලුම් පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 06 තෙක් පළමුවන පිටුවට ද, ඉතිරිය දෙවන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතු අතර ඊට අදාළ තොරතුරු තම අත් අකුරින්ම පැහැදිලි ඇතුළත් කළ යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති බව දන්වමි. තවද , සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුය.එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප කරන බව වැඩිදුරටත් සඳහන් කරමි.ඉල්ලුම්පත්‍රය පිළියෙළ කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද යෙදීම අවශ්‍ය බව දන්වමි.

07. විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගය පවත්වනු ලබන අතර එය පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීතිරීති පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති. විභාගය සඳහා වන නීතිරීති මෙම නිවේදනය අවසානයේ පළ කොට ඇත.

08. ඉල්ලුම්පත් 2016 සැප්තැම්බර් මස 17 වැනි දින හෝ ඊට ප්‍රථම විභාග කොමසාරිස් ජනරාල් , සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ ලිපිනයට ලැබෙන පරිදි කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ / කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ / පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් හෝ ඔබේ සේවා ප්‍රධානියා මගින් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මෙදිනට පසු එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

09. නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 02ක් හෝ 03ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. එසේ දැන්වීමේදී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා අයදුම් කළ විභාගයේ නම සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර අයදුම්කරුවෙකු නම් එම විස්තර සමඟ ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවිය හැකි ෆැක්ස් අංකයක්ද සහිත ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසීම වඩාත් ඵලදායී වේ. විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන අවස්ථාවේ අවශ්‍ය වුවහොත් අයදුම්කරුගේ අපේක්ෂකත්වය තහවුරු

කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදාළ වේ නම් ඒ සඳහා වූ ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සුදනමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

10. (i) අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතුය. විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂකයෙකුම විභාගයේ පළමුවැනි දින තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාරදිය යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ii) ඉහත 08 ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයින්ගේ (පසුව ඉදිරිපත් කරනු ලබන) පැමිණිලි සලකා බලනු නොලැබේ.

11. විභාග ශාලාවේදී තමන්ගේ අනන්‍යතාව තහවුරු කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කිරීම අපේක්ෂකයින්ගේ වගකීම වේ. ඒ සඳහා,

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත, හෝ

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ පමණක් පිළිගනු ලැබේ.

12. විභාග ගාස්තු :

(අ) මෙම විභාගය සඳහා අයකරන ලද ගාස්තු මොනයම් හේතුවක් මත හෝ ආපසු ගෙවනු නොලබන අතර වෙනත් විභාගයක ගාස්තුවකට මාරු කිරීමට ද ඉඩ දෙනු නොලැබේ.

(ආ) සම්පූර්ණ විභාගය හෝ ඉන් කොටසක් සඳහා හෝ පළමුවැනි වතාවේදී ගාස්තු අයකරනු නොලැබේ.

(ඇ) ඊට පසු එක් එක් වතාව සඳහා අය කෙරෙන ගාස්තු පහත දැක්වේ.

| | | |
|---|---|---|
| සම්පූර්ණ විභාගය සඳහා | : | රු. 400 |
| එක් විෂයයක් සඳහා | : | රු. 200 |

මෙම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂය 2003-02-13 ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා එවිය යුතුය. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලැබේ.

13. විභාග පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇති බව දන්වමි.

14. සිංහල හා දෙමළ භාෂා මාධ්‍යයන්ගෙන් පළවන නිවේදනයන්හි පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් පවතී නම් එහිදී සිංහල මාධ්‍යයෙන් වන නිවේදනය බලාත්මක වේ.

15. මෙම නිවේදනය මගින් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතුය.

ඩබ්. එම්. බන්දුසේන,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

පැලවත්ත,
ඉසුරුපාය,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

**ආදර්ශ ඉල්ලුම්පත්‍රය**

***ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2 වන පන්තියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016***

**Efficiency Bar Examination for Officers in class, 2 in Sri Lanka Principals Service - 2016**

(කොට්ඨාස හෝ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/පළාත් අධ්‍යාපන අධ්‍යක්‍ෂ මගින් විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ වෙත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කරන්න. විභාගයේ නම කවරයේ වමත්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.)

1. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

   සිංහල - 2 ☐
   දෙමළ - 3

2. (i) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

   (උදා :- HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

   (ii) අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොද නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :———.
   (උදා :- GUNAWARDHANA, H. M. S. K.)

   (iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

3. ලිපිනය ඃ

(i) පෞද්ගලික :————.

(ii) රාජකාරි :————.

(iii) ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————. (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

(iv) දුරකථන අංකය ඃ (රාජකාරි) :————.

4. (i) විදුහල්පති සේවයේ පන්තිය/ශ්‍රේණිය :————.

(ii) පාසල/කාර්යාලය :————.

(iii) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව/කලාප අධ්‍යාපන කාර්යාලය :————.

5. (i) ජාතික හැඳුනුම්පත් අංකය ☐☐☐☐☐☐☐☐☐☐

(ii) උපන් දිනය ඃ

වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

(iii) ස්ත්‍රී / පුරුෂ භාවය ඃ පුරුෂ - 0 ස්ත්‍රී - 1 ☐

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

6. *ගැසට්* නිවේදනයෙහි 02 වන ඡේදයේ (අ) යටතේ දක්වා ඇති විෂය අංකය සහිතව අයදුම් කරනු ලබන විෂයයන්

| | | | |
|---|---|---|---|
| විෂය අංක 01 | - | පාසල් පරිපාලනය හා අධීක්ෂණය | ☐ |
| විෂය අංක 02 | - | පාසැල් සැලසුම්කරණය | ☐ |
| විෂය අංක 03 | - | අධ්‍යාපනයේ නව ප්‍රවණතා හා ව්‍යවහාර | ☐ |

අදළ විෂයය අංකය/අංක කොටුව/කොටු තුළ ලියන්න.

7. මීට ප්‍රථම අංක 1086/26 හා 1999.07.02 දිනැති ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාව අනුව පැවැති කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙහි පාසල් පරිපාලනය හා අධීක්ෂණය විෂයය සමත් නිලධාරීන් අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 33/2014 පරිදි මෙම 2 වන කාර්යක්ෂමතා කඩඉමෙහි පාසල් පරිපාලනය හා අධීක්ෂණය විෂයය සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ. එම විෂයය සමත් නම් වසර, සමාර්ථය හා මාධ්‍යය ද සඳහන් කරන්න.

| *විෂයය* | *වසර* | *සාමාර්ථය* | *මාධ්‍යය* |
|---|---|---|---|
| පාසල් පරිපාලනය හා අධීක්ෂණය | | | |

8. විභාග ගාස්තු ගෙවා ලබාගත් ලදුපතේ විස්තර ඃ

ලදුපත් අංකය :————.
තැපැල් කාර්යාලය :————.
දිනය :————.

ලදුපත මෙහි අලවන්න.

9. ඉහත සඳහන් තොරතුරු නිවැරදි බව ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මා එකඟ වෙමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

10. විභාග කොමසාරිස් ජනරාල්,

ඉහත විස්තර දක්වෙන අපේක්ෂකයා මගේ කොට්ඨාසයේ/කලාපයේ/පළාතේ නිලධාරියෙකු බව සහතික කරමි. තවද අපේක්ෂකයා විභාග ගාස්තුවෙන් නිදහස් බවද/අපේක්ෂකයා විභාග ගාස්තු සඳහා වන ලදුපත නිවැරදිව අලවා ඇති බව ද සහතික කරමි.

————,
කොට්ඨාස හෝ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ/
අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ/
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සන.

ලිපිනය :————.
දිනය :————.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)
(අදළ නොවන වචන කපා හරින්න.

08-811/1

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.